# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2154/7 - 2019 දෙසැම්බර් මස 17 වැනි අඟහරුවාදා - 2019.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය: ශ්‍රීජපුර/ඉඅ/77/යූඩීජී.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ ගමේ අංක 514C, ඔබේසේකරපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක කො.9840 හා 2019.10.03 දිනැති මූලික පිඹුරෙහි කැබලි අංක 1,2,3 සහ 4 න් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්.0.5635 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි හතර (04).

1. **කැබලි අංක 1**

ඉඩමේ නම: රාජගිරිය කුඹුර, ඔබේසේකරපුර වත්ත, අරුණෝදය මාවතේ වරිපනම් අංක 148/B සහ තවත්; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිලි 2ක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, තාවකාලික ගොඩනැගිල්ලක් සහ තාවකාලික ගොඩනැගිල්ලක කොටසක්; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0083.

2. **කැබලි අංක 2**

ඉඩමේ නම: සඳහන්ව නොමැත; ඉඩම් පරිහරණය: සිමෙන්ති කාණුව; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0009.

3. **කැබලි අංක 3**

ඉඩමේ නම: රාජගිරිය කුඹුර, ඔබේසේකරපුර වත්ත, අරුණෝදය මාවතේ වරිපනම් අංක B151/1 සහ තවත්; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිලි 12ක්, තාවකාලික ගොඩනැගිලි 20, ස්ථිර ගොඩනැගිලි 2 ක කොටස් සහ තාවකාලික ගොඩනැගිලි 2 ක කොටස් ඇත; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1363.

4' **කැබලි අංක 4**

ඉඩමේ නම: රාජගිරිය කුඹුර, ඔබේසේකරපුර වත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත සහ ක්‍රීඩාපිටිය ස්ථිර ගොඩනැගිලි 2 ක් ඇත; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4180.


1A - G 031654 - 15 (2019/12)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2019 දෙසැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00 ට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019 දෙසැම්බර් මස 20 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් පෑමට සහාය වන සියලුම ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

වයි.කේ. ශිරෝමි ජීවමාලා,
ප්‍රාදේශීය ලේකම්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

2019 දෙසැම්බර් මස 12 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

1-111

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.